හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 30 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.55,168 ක් රු.9,045 ක් ලෙස ණයහිමියන් යටතේ දැක්වීම හේතුවෙන්, ණයහිමියන් රු.46,123 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ අයිතම 07 ක එකතු වටිනාකම රු.7,155,586 ක් වූ අතර, එයින් වසරක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.3,399,483 ක් විය. 2018 ජූනි 30 දිනට රු.5,278,919 ක මුදලක් තවදුරටත් අය විය යුතුව පැවතුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට පැවති කර්මාන්ත හා විවිධ ණයහිමි ශේෂ එකතු වටිනාකම රු.41,809,905 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ශේෂවල එකතුව රු.119,440 ක් විය. 2018 ජූනි 30 දිනට රු.13,056,320 ක මුදලක් තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි.

**1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

**අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.8,582,746 ක් වූ ගිණුම් විෂයන් 08 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.**

## 1.3.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| | | | රු. | |
| (අ) | | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | |
| | | 24(1) වගන්තිය | -- | 2012 වර්ෂයෙන් පසුව මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | | |
| | (i) | 155 රීතිය | -- | පී.එස්.10 ආකෘතිය ප්‍රකාරව ප්‍රධාන මුදල් පොත පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| | (ii) | 218 රීතිය | -- | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | (i) | මුදල් රෙගුලාසි 1646 | -- | වාහන 08 ක ධාවන සටහන් වර්ෂයකටත් වඩා වැඩි කාලයක සිට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 371(2)(ආ) | -- | අවස්ථා 03 කදී දෙන ලද රු.54,500 ක අත්තිකාරම් කාර්යය නිම කර මාස 04 – 06 ත් අතර කාලයක් ප්‍රමාද කර පියවා තිබුණි. |
| (ඇ) | | වෙනත් | | |
| | | 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව 2008 ක් වූ ජනවාරි 25 දිනැති අංක 1533/ 16 දරන අති විශේෂ ගැසට් පත්‍රය | -- | ගැසට් පත්‍රයේ ප්‍රකාශිත පරිදි පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දිය යුතු කර්මාන්ත 13 ක් වෙනුවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.56,303,420 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.45,694,091 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 11,281,000 | 11,790,150 | 11,067,117 | 5,755,314 | 10,532,000 | 11,139,644 | 11,650,774 | 5,032,280 |
| (ii) | කුලී | 1,853,000 | 1,379,230 | 1,443,320 | 62,010 | 1,853,000 | 1,312,365 | 783,565 | 206,100 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,400,000 | 2,298,541 | 2,423,070 | 21,405 | 1,940,000 | 1,945,500 | 2,669,220 | 145,934 |
| (iv) | වෙනත් ආදායම් | 45,663,400 | 45,972,587 | 17,089,025 | 66,994,365 | 41,560,400 | 38,663,781 | 54,714,542 | 36,636,091 |
| | එකතුව | 61,197,400 | 61,440,508 | 32,022,532 | 72,833,094 | 55,885,400 | 53,061,290 | 69,818,101 | 42,020,405 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

----------------------------------------

සමස්ත ආදායම් ප්‍රභවයන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට පැවති හිඟය රු.42,020,405 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එම වටිනාකම රු.72,833,094 ක් වීම හේතුවෙන්, හිඟ ආදායම්වල වර්ධනය සියයට 73 ක් විය. 2018 ජූනි 30 දිනට රු.70,956,427 ක මුදලක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

#### 2.2.3 වරිපනම් හා බදු

-----------------

(අ) 2017 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් ශේෂය රු.4,755,646 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.10,597,050 ක් වී තිබුණි. 2017 දෙසැම්බර් 31 දින වන විට ඉන් පිළිවෙලින් රු.2,544,740 ක් හා රු.7,350,662 ක් අය කර තිබුණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 53 ක් හා සියයට 69 ක් විය. 2017 දෙසැම්බර් 31 දිනට රු.5,457,294 ක හිඟ ශේෂයක් පැවති අතර, ආදායම් රැස් කිරීම දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට රු.85,750 ක්ව පැවති හිඟ අක්කර බදු ශේෂය වර්ෂ 10 කටත් වඩා වැඩි කාලයක සිට හිඟව පැවතුණි.

(ඇ) (i) 2017 දෙසැම්බර් 31 දිනට රු.96,270 ක හිඟ ජල බදු මුදලක් පැවති අතර, ඉන් රු.20,495 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට හිඟව පැවතුණි.

(ii) මහතැන්න ජල යෝජනා ක්‍රමයේ ගාස්තු නොගෙවීම නිසා, ජල පාරිභෝගිකයින් 07 දෙනෙකුගේ ජල සම්බන්ධතාවය විසන්ධි කර වසරකටත් අධික කාලයක් ගත වී ඇතත්, රු.17,230 ක හිඟ මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 වෙනත් ආදායම්

-----------------

2017 ජනවාරි 01 දිනට හිඟ හිටි ත්‍රීරෝද රථ ආදායම රු.400,400 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම රු.534,700 ක් විය. දෙසැම්බර් 31 දිනට රු.537,100 ක හිඟ ශේෂයක් පැවති අතර, එම ශේෂයෙන් රු.495,300 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට හිඟව පැවතුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,548,747 ක් හා මුද්දර ගාස්තු රු.63,072,756 ක් විය. 2018 ජූනි 30 දින වන විට උසාවි දඩ රු.80,269 ක් තවදුරටත් අය විය යුතුව පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

3.1 කාර්යසාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියේ දක්වන ලද ප්‍රධාන කාරණා 04 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

---------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධව සැලැසුම් කරන ලද කාර්යයන් 05 කට අදාළ කාර්යයන් පරීක්ෂා කිරීමේ දී කාර්යයන් 02 ක් ආරම්භ කිරීම පමණක් සිදු කර තිබීමෙන් ක්‍රියාකාරී සැලැස්ම පරිදි සභාව කටයුතු සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

-------------------------------------

රු.7,150,000 ක වටිනාකමකට සකස් කළ සංවර්ධන යෝජනා 27 ක් පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය සඳහා 2017 මාර්තු 30 දින ඉදිරිපත් කර, ඉන් රු.6,650,000 ක වටිනා ව්‍යාපෘති 26 ක් 2017 අගෝස්තු 22 දින අනුමත කර ගෙන තිබුණි. දෙවන අදියර යටතේ 2017 සැප්තැම්බර් 20 දින රු.1,850,000 ක් වටිනා සංවර්ධන යෝජනා 09 ක් අනුමැතියට ඉදිරිපත් කර 2017 ඔක්තෝබර් 30 දින අනුමත කර ගෙන තිබුණි. මෙම කාල

ප්‍රමාදයන් මත වර්ෂය අවසානයේ දී සංවර්ධන යෝජනා ඉටු කිරීමට කටයුතු කිරීමෙන් කාර්යසාධනය පහළ මට්ටමක පවතින බවක් නිරීක්ෂණය විය.

(ඈ) ක්‍රියාත්මක නොකළ කර්තව්‍යයන්

---

(i) සෞඛ්‍ය වැඩසටහන යටතේ සහා බලප්‍රදේශයේ කසළ ලබා ගැනීම සඳහා වාහනයක් යාමට නොහැකි ස්ථාන ආවරණය කරමින් කසළ ලබා ගැනීම සඳහා ත්‍රීරෝද රථයක් මිල දී ගැනීමට රු.750,000 ක් හා බයෝ ගෑස් ඒකකයක් සැකසීම සඳහා රු.150,000 ක මුදලක් වාර්ෂික අයවැය ලේඛනයෙන් වෙන් කර තිබුණ ද, එකී අරමුණුගත කාර්යයන් ඉටු කර නොතිබුණි.

(ii) කාන්තා අභිවෘද්ධි වැඩසටහන්, ප්‍රජා සංවර්ධන වැඩසටහන්, ව්‍යාප්ත සේවා හා දිළිඳුකම පිටුදැකීමේ අරමුණ සහිත වැඩසටහන් 04 ක් වෙනුවෙන් වෙන් කර තිබුණු රු.850,000 ක ප්‍රතිපාදන උපයෝජනය කර අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78(1) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මහජන සෞඛ්‍ය වැඩසටහන් යටතේ වැය විෂයයන් 06 කට වෙන් කර තිබූ රු.175,000 ක් අරමුණුගත කාර්යයන් ඉටු කර ගැනීමකින් තොරව සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි.

(ඉ) අපේක්ෂිත නිමවුම් මට්ටම ළඟා කර නොගැනීම

---

කසළ බැහැර කිරීම සඳහා කොම්පෝස්ට් බඳුන්වල හා පොලිතින්වල අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගැනීමකින් තොරව දළ අගයක් ලෙස රු.800,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දී ප්‍රතිපාදන වෙන් කරවා ගෙන වර්ෂය තුළ කොම්පෝස්ට් බඳුන් 87 ක් මිල දී ගෙන රු.296,700 ක් වැය කර තිබුණි. අදාළ කාර්යය ඉටු කිරීම සඳහා ප්‍රතිපාදන යෙදවීමේ ප්‍රතිශතය සියයට 38 ක් වී තිබුණි.

(ඊ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය.

---

ප්‍රධාන මාර්ගවල හා අතුරු මාර්ගවල දිරන හා නොදිරන වශයෙන් එකතු කරන කසළ මහනුවර මහා නගර සභාව සතු ගොහාගොඩ කසළ අංගනය වෙත දෛනිකව කසළ ටොන් 08 – 10 අතර ප්‍රමාණයක් බැහැර කරන නමුත්, කොම්පෝස්ට් නිෂ්පාදනය හෝ වෙනත් කළමනාකරණ ක්‍රමවේදයක් කෙරෙහි ප්‍රාදේශීය සභාව යොමු වී නොමැති බවක් නිරීක්ෂණය විය.

(උ) තිරසාර සංවර්ධන ඉලක්ක

---

ප්‍රාදේශීය සභාව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් තිරසාර සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර, තිරසාර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් දැනුවත් වීමක් සිදු වී නොතිබුණි.

**3.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 03 වගන්තියේ සඳහන් කාර්යයන් ඉටු කිරීමට ප්‍රාදේශීය සභා අරමුදල යොදවා ගත යුතු වුවත්, පනතේ විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ අවස්ථා 03 කදී රු.11,500,000 ක මුදලක් මහජන බැංකුවේ හා ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

(ආ) පුස්තකාල පොත් බැඳීමේ කටයුතු පුස්තකාල සහායකයින් ලවා ඉටු කරවා ගැනීමේ හැකියාව තිබියදී, සමාලෝචිත වර්ෂයේ අවස්ථා 07 කදි රු.289,320 ක් පෞද්ගලික ආයතනයකට ගෙවා පොත් බැඳීම් කටයුතු ඉටු කරවා ගෙන තිබුණි.

**3.3** මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

(අ) සේවක මණ්ඩල කළමනාකරණය.

-----------------------------------

2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව අතර පුරප්පාඩු 12 ක් හා අතිරික්ත තනතුරු 01 ක් පැවතුණි.

(ආ) සේවක ණය

--------------

සේවය හැර ගිය, මිය ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 11 දෙනෙකුගෙන් 2012 වර්ෂයටත් පෙර සිට අය විය යුතු රු.50,871 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4** මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

(අ) සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාදේශීය සභාව වෙත ලැබී තිබූ පැමිණිලි 376 ක් පරීක්ෂා කර, වාර්තා කිරීම සඳහා තාක්ෂණ නිලධාරීන් හා පරිසර නිලධාරීනී වෙත පවරා ඇතත්, 2017 දෙසැම්බර් 14 දින වන විට ඉන් පැමිණිලි 152 ක් සම්බන්ධව පරීක්ෂා කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. ඉන් පැමිණිලි 26 ක් සම්බන්ධව 2018 ජූනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 – 2017 කාල පරිච්ඡේදය තුළ විවිධ කාර්යයන් වෙනුවෙන් අය විය යුතුව තිබුණු රු.128,143 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ දී දිළිඳු නිවාස වැඩසටහන වෙනුවෙන් පළාත් සභාවෙන් ලද රු.1,000,000 ක මුදලින් ඉතිරි වී තිබුණු රු.25,000 ක මුදල ආපසු යැවීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු නොකර ගිණුම්වල රඳවා ගෙන තිබුණි.

**3.5** වත්කම් කළමනාකරණය

---------------------------

**3.5.1** නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

ධාවන තත්ත්වයේ පවතින රු.10,128,144 ක් වටිනා විවිධ වර්ගයේ වාහන 05 ක් රියැදුරන් නොමැති වීම මත ධාවනයට යොදවා නොගෙන ඌන උපයෝජිතව සභා භූමියේ හා මැදවල වෙළඳ සංකීර්ණ භූමියේ ගාල් කර තිබුණි.

**3.5.2** ගබඩා පාලනය

-----------------

ගබඩා තොග ලෙජර ශේෂ හා භෞතික ශේෂ සම්බන්ධයෙන් කරන ලද නියැදි පරීක්ෂාවේ දී රු.21,385 ක් වටිනා භාණ්ඩ අයිතම 03 ක අතිරික්තයක් හා රු.21,318 ක් වටිනා භාණ්ඩ අයිතම 07 ක ඌනතාවයක් පැවතුනි.

**3.6** ප්‍රසම්පාදනය

--------------

ප්‍රසම්පාදන සැලැස්ම

---------------------

රු.43,649,323 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**4.** ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------

**4.1** අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් අතර ආදායම් විෂයයන් 03 ක සියයට 20 සිට සියයට 160 දක්වා ද, වියදම් විෂයයන් 06 ක සියයට 22 සිට සියයට 76 ක් දක්වා ද විචලනයක් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**4.2** අභ්‍යන්තර විගණනය

------------------------

අභ්‍යන්තර විගණන නිලධාරිනියට වෙනත් රාජකාරී කටයුතු පවරා තිබීම හේතුවෙන්, ප්‍රමාණවත් හා ස්වාධීන අභ්‍යන්තර විගණනයක් කිරීමට නොහැකි වී තිබුණි.

**5.** පද්ධති හා පාලනය.

-----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | i. හිඟ ආදායම් අය නොකිරීම<br>ii. දේපළ තහනම් කිරීමේ ක්‍රියාවලිය සඳහා යොමු නොවීම |
| (ආ) | වත්කම් කළමනාකරණය | i. වත්කම් නිසි පරිදි උපයෝජනය නොකිරීම<br>ii. වත්කම් ඌන උපයෝජීතව පැවතීම |
| (ඇ) | ණයගැතියන් හා ණයහිමියන් | i. නිවැරදිව ගිණුම්ගත නොකිරීම<br>ii. ණයහිමියන් නිරවුල් නොකිරීම |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ගබඩා පාලනය | i. | ලේඛන විධිමත්ව නඩත්තු නොකිරීම |
| | | ii. | අපහරණය කළ යුතු වත්කම් අපහරණය නොකිරීම |
| (ඉ) | අයවැය පාලනය | i. | ඇස්තමේන්තු ප්‍රතිපාදන වැය නොකිරීම |
| | | ii. | ඇස්තමේන්තුගත ආදායම් අය නොකිරීම |